සමනලවැව එල්ලංගා පැතිකඩ හා එල්ලංගා

කළමනාකරණ සැලැස්ම

කෘෂිකර්ම අමාත්‍යාංශය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යෂක කාර්යාලය - වයඹ පළාත

පටුන

1.	හැඳින්වීම..	4
1.1	සමනලවැව එල්ලංගාව හා එහි පිහිටීම..	4
1.2	සමනළවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා.................	7
1.3.	සමනළවැව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු...	9
1.4	සමනළ වැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් කම.	10
1.5	එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම..	12
1.6	එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය...	15
1.7	පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු.....	15
1.8	පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම...	15
2	සමනළවැව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය............	17
2.1	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු..	18
3	සමනළවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම................	19
4	සමනළවැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ...	19
4.1	භූගෝලීය (Geographical)තොරතුරු..	19
4.2	භූ විද්‍යාත්මක (Geological) තොරතුරු...	20
4.3	පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු...	21
4.4	එල්ලංගාවේ පවතින ඉදිකිරීම්..	22
4.5	ජල විද්‍යාත්මක හා වාරිමාර්ග කළමනාකරණය තොරතුරු............................	22
4.6	එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු..	25
4.7	එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා පිලිබඳ තොරතුරු.........	26
4.8	එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග..	26
4.9	උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්.......	27
4.10	උපාය මාර්ග සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව හා සම්බන්ධිතයන්.....	30

4.11 ක්‍රියාත්මක සැලැස්ම.. 34

01. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.
වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් ''දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ'' සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

1.1. සමනලවැව එල්ලංගාව හා එහි පිහිටීම

ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයේ වයඹ පළාතේ බටහිර වෙරළට ආසන්නව පිහිටා ඇති පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළබඩ බිම්තීරයක් වන වනාතවිල්ලුව එල්ලංගාව උතුරින් කලා ඔය හා මෝදරගම් ආරු ද, නැගෙනහිරින් කරුවලගස් වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටද, බටහිරින් ඉන්දියන් සාගරයට මායිම් වේ. පුත්තලම් දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 අතුරින් විශාලතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වනාතවිල්ලුව වේ. මුහුදු මට්ටමේ සිට අඩි 200 - 250 ඉහලින් පිහිටා ඇති මෙම භූමියෙහි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 733.53 කි. මෙම භූමියෙන් 92% ක් කෘෂි පාරිසරික කලාපයට අයත්ය. එනම් වර්ග කි.මි. 681.97 (92%) කෘෂි භූමි වන අතර ඉතිරි භූමි ප්‍රමාණය වර්ග කි.මි. 51.56 කි. 2018 සංඛ්‍යා දත්ත වලට අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයේ මුළු ජනගහනය 18892 කි. මුළු ජනගහනයෙන් 56.4% ක් සිංහල වන අතර 35.8% ක් මුස්ලිම් හා ශ්‍රී ලංකා දෙමල වශයෙන් ව්‍යාප්තව ඇත. මුළු නිවාස සංඛ්‍යාව 4680කි.
මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂය විශාල වශයෙන් නියගයේ බලපෑමට ලක්වන ප්‍රදේශයක් වන අතරම වර්ෂාවත් සමග අධිකලෙස ගංවතුරෙන් යටවන කලාපයකි. වැව් යටතේ වී වගාව ප්‍රමුඛ වන අතර එල්ලංගාව ප්‍රදේශයේ ගොඩ ඉඩම් වල කජු හා පොල් වගාව බහුල වශයෙන් දැකගත හැකිය. මෙම ඉඩම් අක් 5/ 10/ 25 වශයෙන් ව්‍යාප්තව පවතී.


PUTTALAM
Map Locator
Mannar
Vanathavilluwa
Anuradhapura
Kalpitiya
Karuwalagaswewa
Puttalam
Nawagattegama
Anamaduwa
Mundalama
Mahakumbukkadawala
Pallama
Arachchikattuwa
Indian Ocean
Kurunegala
Matale
Chilaw
Madampe
Mahawewa
Nattandiya
Wennappuwa
Dankotuwa
Kandy
Kegalle
Gampaha
Kilometers
0 5 10 20 30 40


WANATHAWILLUWA DSD
SAMANALA WEWA CASCADE
N
02
03
TO MUNGAL ARU
09
05
04
10
TO MUNGAL ARU
07
08
01
06
TO MUNGAL ARU
SOURCE: PRA, JANATHAKSHAN 2019



Samanalawewa Cascade in Vanathavilluwa DSD
Landuse Types
12000
10000
8000
6000
4000
2000
0
ACRES
10253
5100
2879
254
94
32
16
13
Forest
Coconut
Undefined
Home Garden
Sand
Marsh
Scrub
Tank
LAND USE TYPES
Vanathavilluwa DSD
1:650,000
Kadirankadu Wewa
Vanathawilluwa North
Wijayapura West
Wijayapura East
Mahaweerakuliya Wewa
Vanathawilluwa South
Moongil Aru
PUTTALAM LAGOON
Karadipuwal
Legend
Drianage
Secondary Road
Cart Road
Home Garden
Sand
Railway
GNDs
Lagoon
Scrub
Coconut
Marsh
Stream
Forest
Undefined
Tank
0
1.25
2.5
5
Km
1:75,000
Data Source :- Department of Survey
Compiled By :- Mr. Sampath Arunashantha
(Sampathgeo@kln.ac.lk)

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් සමනළවැව එල්ලංගාව

අනු අංකය	එල්ලංගාවේ වැව්	වැවේ විශාලත්වය අක්කර	ග්‍රාම සේවක වසම	කුඹුරු අක්කර	ගොඩ අක්කර	ගොවීන් සංඛ්‍යාව
01	කුඩා තම්මැන්නාකුලම	13	විජයපුර ඊසාන 636/3	06	12	17
02	මහා තම්මැන්නාකුලම	24	විජයපුර ඊසාන 636/3	20	08	75
03	මහවීරක්කුලිය වැව	30	විජයපුර ඊසාන 636/3	37	20	63
04	ජය වැව	02	විජයපුර ඊසාන 636/3	2.5	35	34
05	පහන් වැව	24	විජයපුර ඊසාන	09	08	18
06	පුංචි වීරක්කුලිය වැව	12	විජයපුර ඊසාන 636/3	12	06	23
07	සමනල වැව	35	විජයපුර ඊසාන 636/3	26	20	65
08	කදිරන්කාඩු වැව	32	වනාතවිල්ලුව උතුර 636/2	63	05	63
09	නාගමඩුව වැව	22	වනාතවිල්ලුව දකුණ 636/1	22	12	60
10	සාලියපුර වැව	22	කරන්ඩිපුවල් 637/3	22	30	30
	එකතුව			219.5	156	448

(එල්ලංගාවේ වැව් හා ඒ යටතේ පවතින කුඹුරු)

1.2. සමනළවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

පුත්තලම් දිස්ත්‍රික්කයේ විශාලතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂය වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයයි. ග්‍රාමසේවක වසම් 16 කින් සමන්විත මෙම ප්‍රදේශය තුළ කුඩා වැව් 69 ක් පිහිටා ඇති අතර මෙම වැව් ඒකාබද්ධ කරමින් ආසන්නයේ තවත් එල්ලංගා පද්ධති 04 ක් පිහිටා ඇත. මැදවච්චිය, ආචිරිගම, පහළ වගයාමඩුව, නෙලිවැව එම එල්ලංගා පද්ධතිවේ. පහත සඳහන් වගුව අනුව ප්‍රදේශයේ පිහිටි වෙනත් එල්ලංගා පිළිබඳව විග්‍රහ කරයි. මෙම එල්ලංගා දිස්ත්‍රික්කය තුල පවතින්නේ එල්ලංගා 5 ක් වශයෙනි. පහල වගයාමඩුව එල්ලංගාව හැර අනෙකුත් එල්ලංගා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය වේ. මෙම ප්‍රදේශ වල එල්ලංගා කළමනාකරණ කමිටුව නිෂ්පාදන සමිති හා සමාජ විගණන කමිටු යන ආයතන පිහිටා ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම ප්‍රජාවට ව්‍යාපෘතිය යටතේ විවිධ පුහුණු හා නවතම කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ ලබා දී ඊට අදාල පුහුණුවීම් ද ලබාදී ඇත.

ප්‍රදේශයේ පිහිටි වෙනත් එල්ලංගා

එල්ලංගාවේ නම	ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය	වැව් සංඛ්‍යාව	පිහිටීම
සමනල වැව	වනාතවිල්ලුව	10	
මැදවච්චිය	නවගත්තේගම	20	මී ඔය ද්‍රෝණිය
ආවිරිගම	නවගත්තේගම	13	නාන්නේරි ඔය (මී ඔය ද්‍රෝණිය තුළම)
පහල වගයාමඩුව	නවගත්තේගම	16	නාන්නේරිය මී ඔය ද්‍රෝණිය
නෙලිවැව	කලුවරගස්වැව	10	

ප්‍රදේශයේ පිහිටි වෙනත් එල්ලංගා

1.3 එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

තොරතුරු	විස්තරය
දිස්ත්‍රික්කය	පුත්තලම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	වනාතවිල්ලුව
මැතිවරණ බල ප්‍රදේශය	කළුවරගස්වැව
ගංගා ද්‍රෝණියේ නම	මී ඔය
එල්ලංගාවේ නම	සමනළවැව
ගොවිජන සේවා බල ප්‍රදේශය	වනාතවිල්ලුව
ග්‍රාම නිලධාරී වසම්	05
එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්	7504.4
ජලපෝශක ප්‍රදේශයේ නම	මුංගිල්ආරු (වැලි ඇල)
පැහැදිළි ජල පෝෂක සංඛාව	03
කෘෂිකාර්මික කටයුතු සදහා භාවිතා කරණ වැව් සංඛ්‍යාව	10
වනාන්තර ප්‍රදේශ හෙක්.	4101
මුඩු බිම්	හෙක්. 16
එල්ලංගාව තුල ජීවත්වන පවුල් ගණන	418
එල්ලංගාව තුල ගෙවතු කුඹුරු හා අතිරේක ආහාර බෝග පොල් හා කජු වගා කරන භූමි ප්‍රමාණය හෙක්.	2190
පුණරුත්ථාපනය නිමකල වැව් සංඛ්‍යාව	07
පුණරුත්ථාපනයට නියමිත වැව් සංඛ්‍යාව	03

එල්ලංගාව තුල වගා තොරතුරු

අනු අංකය .	වැවේ නම	වැව යටතේ පවතින කුඹුරු ඉඩම් (අක්කර)	සැබෑ වගා කළ හැකි ප්‍රදේශය (අක්කර)	
			යල	මහා
1	සමනල වැව	26	8	37
2	මහතම්ණෑව වැව	20	1	35
3	කුඩා තම්මැන්නාව වැව	6	13	13
4	පුංචි වීරක්කුලිය වැව	12	0	18
5	මහා වීරක්කුලිය වැව	37	15	47
6	ජය වැව	2.5	0	5
7	සාලියපුර වැව	22	8	8
8	පහන් වැව	09	0	15
9	කදිරන්කඩුව වැව	63	15	63
10	නාගමඩුව වැව	22	8	4.75
මුළු		219.5	68	245.75

1.4 සමනළ වැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

සමනල වැව එල්ලංගාව තුළ පිහිටි සමස්ත භූමි ප්‍රමාණය හෙක් 7504 කි. මින් ඉහත සඳහන් වැව් 10 යටතේ කුඹුරු හෙක් 88 ක් පමණ පිහිටා ඇති අතර ගොඩ ඉඩම් හෙක් 2190 පමණ වේ. එල්ලංගාව තුළ කුඹුරු හා අතිරේක බෝග වගාව පොල් හා කජු වගාව සිදුකරන අතර මෙම වගා කටයුතු වල නිරත වන ගොවීන් සංඛ්‍යාව 230 පමණ වේ. එල්ලංගාව තුළ ජීවත්වන සමස්ත ජනගහනය 1739 කි.

මොවුන් සිය ජීවනෝපාය සඳහා එල්ලංගාව තුල විවිධ ආර්ථික ක්‍රියාකාර කම් වල නිරතවේ. එනම් වැව් ඉස්මත්තේ කැලෑ ඉඩම් එළි පෙහෙලි කර සිදුකරන හේන් වගාව, ඒ සඳහා කැලෑ ගිනි තැබීම් හා ගොඩ ඉඩම් වලට අයත් භූමි වල කජු පොල් වැනි ස්ථිර භෝග වගා කිරීම සිදු කෙරේ. එවැනි ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්වෙමින් ඇත. විශේෂයෙන්ම එල්ලංගාවේ කුඹුරු ඉඩම් වල කිවුල හෙවත් ලවණතාවය වැඩි වීමෙන් කුඹුරු වගාව විනාශ වීම, අස්වනු හානි වීම ප්‍රධාන ගැටළුවක් වී ඇත. මීට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වැව් පද්ධතියේ පැවතිය යුතු කට්ටකාඩුව හා කුණු ඇළ පද්ධතිය වැනි අවශ්‍ය කොටස් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාෂ වීමයි. උස්බිම්වල සිදුවන විවිධ වගාවන් නිසා ඇතිවන පාංශු ඛාධනයෙන් වැව් ගොඩවීම ප්‍රබල ගැටලුවකි.

ලවණතාව /ජල ගැලීම් /අනෙකුත් ජල තත්ව ගැටලුවලින් එල්ලංගාවේ බලපෑමට ලක්වී ඇති ප්‍රදේශ

අනුක්‍රමික අංකය		ලවණතාව බලපෑමට ලක් වූ (අක්කර)	ජලය රැඳීම බලපෑමට ලක්ව ඇත (අක්කර)
1	සමනල වැව	5	5
2	මහ තම්මන්නෑව වැව	7	5
3	කුඩා තම්මැන්නාව වැව	3	0

4	පුංචි වීරක්කුලිය වැව	4	0
5	මහා වීරක්කුලිය වැව	5	0
6	ජය වැව	2	0
7	සාලියපුර වැව	8	1
8	පහන් වැව	8	8
9	කදිරන්කඩුව වැව	4	0
10	නාගමඩුව වැව	22	0.5
	මුළු	68	19.5

තවද ජනගහන වර්ධනය හා ඉඩම් බෙදී යාමත් පවතින සම්පත් දිනෙන් දින වේගයෙන් භාවිතයට ගැනීමත් නිසා මෙම ප්‍රදේශවල වැව් ජලය සීග්‍රයෙන් සිදී යාමේ තර්ජනයකට මුහුණ දෙමින් සිටී. ජල මාර්ග සිදී යමින් දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමානවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර ලෙස සංවර්ධනයට භාජනය කිරීමයි. ඒඅනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර සමනළ වැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය එම එල්ලංගාව වෙත යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමනාකරණ කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව එල්ලංගාවේ පහත අත්‍යාවශ්‍ය අංගෝපාංග ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුව ඇත. එහි දී අනුගමනය කලයුතු ප්‍රධාන ක්‍රියාමාර්ග මෙසේය.

සමනලවැව එල්ලංගාව ප්‍රෂස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග

- වැවේ පෝෂිත ප්‍රදේශය සංවර්ධනය. මේ යටතේ ප්‍රමානවත් වෘක්ෂලතා ආවරණයක් පිහිටුවීම හා පවතින වෘක්ෂලතා කලාපය ආරක්ෂා කිරීම.
- වැව් ඉස්මත්තේ සිදු කෙරෙන අණවසර වගාවන් නිසා සිදුවන ප්‍රබල පාංශු ඛාදනය අවම කිරීමට පියවර ගැනීම.
- මෙහිදී වැව තුල අණවසරයෙන් කුඹුරු වගා කරන ගොවීන් ඉවත් කිරීම.
- වැව ඉස්මත්තේ හේන් වගා බිම් සඳහා පාංශු සංරක්ෂණ වැටි දැමීම.
- වැව වටා ශක්තිමත් පෙරණයක් (Filter) යෙදීම.
- පවතින ගොඩ වල පුණරුත්ථාපනය හෝ අවශ්‍ය ස්ථාන වල ආරක්ෂිත වැටි මගින් වැවට ගලා එන ජලය මගින් ගෙන එන දෑ අවම කිරීම. (වැව ගොඩවීමට බලපාන රොන් මඩ, වැලි සහ මැටි, ශාක හා සත්ව කොටස්)
- වැවේ කට්ට කඩුව, ගස්ගොම්මන, ඉස් වැටිය යන අංගයන් හැකි පමනින් නැවත පිහිටුවීම.
- වැවේ හා වාරිමාර්ග පද්ධතියේ නඩත්තුව විදිමත් පරිදි පවත්වාගෙන යාම.
- වැවේ රාජකාරී සම්බන්ධයෙන් පැරණි සිරිත් විරිත් නීති රීති අනුගමනය කිරීමට හා ක්‍රියා ත්මක කිරීමට ගොවි සංවිධාන යොමුකිරීම.
- ඉහත කරුණු පිළිබඳව ගොවි සංවිධාන ගොවීන්ට පුළුල් දැනුමක් ලබාදීම.

- එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව මගින් නිරන්තරයෙන් එල්ලංගාව අධීක්ෂණය කරමින් තත්වය කළමනාකරණය කිරීම හා අදාල වගකිවයුතු ආයතන වල ප්‍රමාණවත් මැදිහත් වීම.



එල්ලංගාවක ආකෘතියක්

1.5 එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමනාකරණයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම් “එල්ලන්” සහ “ගාව” යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 චක්‍ර ලේඛයට අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන
- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමණාකරන කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය
- පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව
- පළාත් පාලන ආයතන

යන ආයතන වේ. එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.

ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.

(වනාතවිල්ලුව එල්ලංගා කමිටු රැස්වීමක්)

එල්ලංගා කළමණාකරන කමිටුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
පළාත් පාලන ආයතන
භූ විද්‍යා හා පතල් කැණීම කාර්යාංශය
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා සංවිධාන, පෞද්ගලික අංශ
පළාත් හා අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ගොවි සංවිධාන හා නිෂ්පාදන සංගම්
පරිසර අධිකාරිය
පොලිස් දෙපාර්තමේන්තුව
ජාතික ජලජ ජීවී අධිකාරිය
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1.6 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහ වැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩසටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන - MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන - ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටුවීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ඡේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.7 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

1.8 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි

පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම, එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හායනයට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදිව දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

සමනළ වැව එල්ලංගාව පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය.
එල්ලංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ,

1 කණ්ඩායම විජයපුර නැගෙනහිර කලාපය (කුඩා තම්මැන්නා කුලම /මහතම්මැන්නා කුලම)
2 කණ්ඩායම කවඩිපුවල් (සැලියවැව/නාගමඩුව)
3 කණ්ඩායම වනාතවිල්ලුව දකුණ (නාගමඩුව)
4 කණ්ඩායම වනාතවිල්ලුව උතුර (සමනළ වැව)
5 කණ්ඩායම විජවිජයපුර නැගෙනහිර (පුංචි වීරක්කුලිය)
6 කණ්ඩායම විජයපුර නැගෙනහිර කලාපය (පහන් වැව)
7 කණ්ඩායම මහවීරක්කුලිය (ජයවැව)

ක්ෂේත්‍ර වැඩසටහන

කණ්ඩායම් 07 ක් මෙම චාරිකාවට සහභාගී විය. සැළසුම් කල බහු අශ්‍ර (Polygon) අනුව ක්ෂේත්‍රයේ නිරීක්ෂණ කටයුතු සඳහා මෙම කණ්ඩායම් යොදාගන්නා ලදී. මෙම සැලැස්ම අනුව සමනළ වැව එල්ලංගා පද්ධති සමස්ථ චාරිකාව කිලෝ මීටර් 16 කින් පමන යුක්ත විය. මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටු සාමාජිකයින්ට ඉදිරිපත් කර එම දත්ත වල නිවැදිතාවය තහවරු කර ගැනීමට

අවශ්‍යවිය. ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු සම්පත් භායනය හා සම්පත් භායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩ මුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තව දුරටත් තහවුරු කරගනු ලැබීය. විශේෂයෙන්ම මෙම තොරතුරු එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතා වැදගත් වේ. තවද එල්ලංගාව පිළිබඳව අධ්‍යයනය කරනු ලබන ආයතන හෝ ව්‍යාපෘති වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධනය සැලසුම් කිරීමේදී මෙම තොරතුරු බෙහෙවින් ඉවහල් වනු ඇත.

2 සමනළවැව එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, සමනළවැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

2.1 සමනළවැව එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍යවේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

1. රැස්වීම් පැවැත්වීම
2. ද්විතීය දත්ත එකතු කිරීම
3. හරස්කඩ වාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
4. එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
5. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
6. එල්ලංගා පැතිකඩ සැකසීම හා ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
7. එල්ලංගා සැලැස්ම සැකසීම
8. පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දළ ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

3. සමනළවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම.

සමනළ වැව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම්,

- භූගෝල විද්‍යාත්මක
- භූ විද්‍යාත්මක
- ජල විද්‍යාත්මක
- පාරිසරික විද්‍යාත්මක
- මානව හැසිරීම්
- සමාජ ආර්ථික
- කෘෂිකාර්මික
- වාරිමාර්ග කළමණාකරන
- පෝෂිත ප්‍රදේශයේ තත්වය යනාදියි.

මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාරකරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

4 සමනළ වැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

4.1 භූගෝලීය (Geographical) තොරතුරු

පුත්තලම් දිස්ත්‍රික්කයේ විශාලතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂය වන වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ටඨාෂයේ ග්‍රාම සේවක වසම් 5 ක් පුරා මෙම එල්ලංගාව පැතිරී ඇත. එල්ලංගවේ ප්‍රධාන මාර්ග පද්ධතිය තරමක් හොඳ තත්වයේ පවතී. එහෙත් අභ්‍යන්තර මාර්ග පද්දතිය අබලන්ය. එල්ලංගාව මැදින් පුත්තලමේ සිට සිමෙන්ති සංස්ථාවට අමුද්‍රව්‍ය ප්‍රවාහනය දුම්රිය මාර්ගය වැටී ඇත . මෙම එල්ලංගාවේ මුළු භූමි ප්‍රමාණය හෙක්. 7504.4 කි. භූ විෂමතාවය අනුව සලකා බලන කල මෙම ප්‍රදේශයේ භූ දර්ෂකය මදක් රැලි සහිත බෑවුම් හා සමතලා බිමකි. උපරිම උන්නතාංශය මුහුදු මට්ටමේ සිට අඩි 90 - 103 ක් පමණ වේ. උතුරින් කලා ඔය

හා මෝදරගම් ආරුද, නැගෙනහිරින් කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයද, බටහිරින් ඉන්දියන් සාගරයටද හා පුත්තලම් කලපුවට මායිම් වන මෙම එල්ලංගාව වැව් 10 කින් යුක්ත වන අතර එල්ලංගාව ග්‍රාමසේවා වසම් 05ක් පුරා පැතිරී යයි. එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව අනුව, සාගරික බලපෑම හා වෙනත් දේශගුණික සාදක අනුව වනාතවිල්ලුව සුවිශේෂී කලාපයකි. ඉන්දියන් සාගරයට හා පුත්තලම් කලපුවට මායිම් වන එල්ලංගාව තුල විවිධ ජීවනෝපාය කාර්යයන්හි නිරත වූ කණ්ඩායම් දැකගත හැකිය. පොල් හා කජු වගාව ව්‍යාපාරික වශයෙන් සිදු කරන පිරිස් ප්‍රදේශයේ සහ ඉන් පිටත සිට මෙහෙයුම් කාර්යයේ නිරත වේ. ප්‍රධාන කජු නිෂ්පාදන කලාපයක් වශයෙන් මෙම ප්‍රදේශය සැලකිය හැකිය. සමනළ වැව එල්ලංගාවේ පහත් බිම් පවතින අතර මෙම ප්‍රදේශ බොහොමයක් ගං වතුරට යටවේ. මේ නිසාම වාර්ෂිකව දියළු පස් හා රොන් මඩ තැන්පත් වීමෙන් වගාවට හිතකර පාංශු පෝෂණයක් ලැබේ.

අනු අංකය	පරිහරණය	හෙක්.
I	වනාන්තර	4101
ii	පොල් හා කජු වගාව	2040
iii	විශේෂයෙන් හඳුනා නොගත්	1151
iv	වගා බිම්	150.4
v	වැලි සහිත භූමි	37.6
vi	වගුරු බිම්	12.8
vii	කටු පඳුරු සහිත බිම්	6 .4
viii	වැව්	5.2

4.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව හෙක්ටයාර් 7504.4 කින් යුක්තය. මෙය තරමක් කුඩා වැව් 10 කින් යුත් එල්ලංගාවකි. එහෙත් මෙම වැව් වලට අමතරව හඳුනා ගත් තවත් කුඩා වැව් 04 ක් හා අමුණු කිහිපයක් දැකගත හැකිය. වැලි ඇල නමින් ආරම්භ වන ප්‍රදේශය හරහා ගලා යන ප්‍රධාන වාන් ඇල මොන්ගිල් ආරු ලෙස එල්ලංගාවෙන් පිටව යයි. ජනාවාස අතර ලඳු කැලෑව ද මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. පුත්තලම් කලපුවට මායිම් වන එල්ලංගාව කලපුව ආසන්නයේදී ලඳු කැලෑවට ව්‍යාප්තව ඇත. වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ව්‍යාප්තව පවතින ගොඩ ඉඩම් අක් 1 සිට 100 හා අතර පොල් කජු වගාව ව්‍යයාපාරික ලෙස සිදුකරනු ලබයි. වී වගාවට මෙන්ම ව්‍යාපාරික ගොඩ බෝග වගාවට සුදුසු භූමි පද්දතියක් පවතී. මුහුදු මට්ටමේ සිට උන්නතාංශය මීටර් 30 සිට 35 දක්වා වෙනස් වේ. කලපුවේ හා එල්ලංගාවේ පහත් බිම් වල බලපෑම අනුව භූ ගත ජල මට්ටම තීරණය වේ. වියළි කාලවලදී භූගත ජල මට්ටම අඩි 25 ක් පමණ ගැඹුරට පහල බසින අතර දැනට ඇතැම් ගම්මාන වල කෘෂි ළිං සහ නළ ළිං හරහා ජලය ලබා ගනී. සාගරික බලපෑම අනුව එල්ලංගාවේ පානීය ජලයේ ලවන තත්වය ඉහල යයි.

වැලි මිශ්‍ර පසක් පවතින එල්ලංගාව කජු හා පොල් වගාවට හිතකරය. මෙම කලාපය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට ඇති හැකියාව සොයා බැලීම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට හා ප්‍රදේශයේ ප්‍රජාවගේ සංවර්ධනයට හේතු වේ. කජු සැකසීමේ කර්මාන්තය එල්ලංගාව තුල ගෘහස්තව ක්‍රියාත්මකවේ. දේශීය සංචාරක ව්‍යයාපාරය සුළු වශයෙන් ක්‍රියාත්මකවේ.

4 .3 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගා පද්ධතිය තුල වැව් 10 ක් පවතින අතර ඒ අතරින් ජය වැව, නාග මඩුව වැව හා සාලියපුර වැව මෙතෙක් දේශගුණ සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කර නොමැත. පහන් වැව ආශ්‍රිතව ජනාවාස නොමැති අතර වැව ඉස්මත්තෙන් හා වැව් කෙලවරෙන් විල්පත්තු රක්ෂිතයට මායිම් වී ඇත. ඒ අනුව මෙම වැව ඕලගම් වැවක් ලෙස හඳුනා ගත හැකිය. වැව සම්පූර්ණයෙන් ජලයන් පිරුණු පසු කන්නය කුඹුරු වගාව ආරම්භ වන අතර ජලය අඩු වීමත් සමගම එහි ලවණතාවය (කිවුල) ඉහල යාම හේතුවෙන් කුඹුරු වගා කල නොහැකිය. සමස්ත එල්ලංගාව තුල කුඹුරු අක්කර 68 ක පමණ ප්‍රමාණයක් කිවුල හේතුවෙන් වගාකිරිමට නොහැකි වී ඇත. සාලියපුර වැව, නාගමුඩුව වැව, පුංචිවීරක්කුලිය, පහන් වැව, සමනළ වැව, කදිරන් කාඩුව යන වැව් ජලයේ (ලවණතාවය) කිව්ල ඉතා ඉහල මට්ටමක පවතියි. මහවීරක්කුලිය වැවෙහි කට්ටකාඩුව යම් ප්‍රමාණයකට ආරක්ෂා වී ඇතත්, පුංචි වීරක්කුලිය, කුඩා තම්මාන්නා කුලම - 350M, මහතම්මැන්නාකුලම - 200M, සාලියපුර වැව - 700M වන ප්‍රමාණයෙන් කට්ටකාඩුව ගස් සිටුවා සංවර්ධනය කල යුතුය. මෙය ලවණතාවය පාලනය කිරීමට බෙහෙවින් ඉවහල් වේ .

ආක්‍රමණික ශාකයක් ලෙස වැව ඉස්මත්තෙත් රක්ෂිතය තුළත් හා ඒ අවටත් ඇකේෂියා ශාඛය ව්‍යාප්ත වී ඇත. එම ශාක පරිසර හිතකාමී නොවීම හේතුවෙන් මෙම ඇකේෂියා ගහණය සම්පූර්ණයෙන් ඉවත් කර පරිසරට හිතකර ශාක වගා කල යුතුය. රක්ෂිත කලාප වල සිට වන අලින් වැවට බැසීම නිසා වැව් බැම්මට හානිවී ඇත. විල්පත්තු රක්ෂිතය එලුවන් කුලම, රාල් මඩුව, පුලියන්කුලම, මොරපොතාව, විජය පුර, සාලියපුර, මයිලන් කුලම, තේවනුවර, තබ්බෝව දක්වා විල්පත්තු රක්ෂිතය ව්‍යයාප්තව ඇත. මෙම පාරිසරික බලපෑම නිසා එල්ලංගාවට වන සතුන්ගේ හානි වැඩිවී ඇත. කජු හා පොල් වගාවට ප්‍රබල බලපෑමක් වන අලියා නිසා සිදුවේ. මොණර ගහනය ඉහල යාම භෝග වගාවට හානි කරයි. එල්ලංගාවේ සියළුම වැව් තුළ හම්බුපන් වැනි ජලජ ශාක ව්‍යාප්ත වී ඇත. පුත්තලම් දිස්ත්‍රික්කයේම වැව් මෙම ආක්‍රමණශීලී ජලජ ශාක වල බලපෑමට ලක්ව ඇත. ජපන්ජබර, හම්බුපන්, සැල්වීනියා, හයිඩ්‍රිල්ලා, දිය හවරිය, කංකුං, කලපු අන්දර, යෝධ නිදිකුම්බා, ඇකේෂියා මෙම පරිසරයේදී බහුලව දැකගත හැකිය. එල්ලංගාව තුල සිදු කෙරෙන මානව ක්‍රියාකාරකම් නිසා විශාල පරිසර හානියක් සිදුවෙමින් පවතී. වැව් ඉස්මත්තේ ඉඩම් අල්ලා ගැනීම් හේතුවෙන් ඒවා තුළ සිදුකෙරෙන හේන් වගාවන් නිසා වර්ශා කාලයේදී පාංශු ඛාදනය සිදුවේ. ඔවුන් වසර ගණනාවක සිට තම ආදායම් මාර්ගයන් ලෙස හේන් ගොවිතැන සිදු කරන බැවින් ගොවීන් එයින් ඉවත් නොවේ. ඊට පිළියමක් ලෙසත් හේන් වගාවන් තුළට අලි පැමිණීම අවහිර කිරීම සඳහාත් යොදන අගල් වැව් ඉස්මත්තේ තිබෙන හේන් වගාවන් සඳහාද යෙදීමෙන් හා පාංශු ඛාදන වැටි මගින් වගා හානි මෙන්ම පාශු ඛාදනයද පාලනය කරගත හැකිය. පලු, වීර ගස් සුළු වශයෙන් දැකගත හැකිය .

4.4 එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව නිරන්තරයන් නිවාස ඉදිකරමින් හා වැඩිදියුනු කිරීම් පවතී. තවද ඉඩම්, ගොඩ ඉඩම් වල සිදුවන පාංශු තට්ටුව කැපීම, ළිං කැපීම හා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂයෙන් මහ කන්නයේ හා හදිසියේ ඇතිවන සංවහන වර්ෂාව සිදුවන අවස්ථා වලදී වේගවත් ව ජලය ගලා යාමත් සමග පාංශු ඛාදනයක් ඇතිවේ. මෙම ඛාදනයත් සමග රොන්මඩ හා පාංශු කොටස් වැව් වල තැම්පත්වීම වැලැක්විය නොහැකිය. කුඹුරු වගාව හැර එල්ලංගාව තුල අක් 1 - 25 කජු හා පොල් වගා බිම් දක්නට ලැබේ. වැව් ඉස්මත්තේ හේන් වගාවද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයකි. මෙහිදී විධිමත් පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කලයුතුය. ප්‍රදේශයේ බොහොමයක් පැවතී රජයේ ඉඩම් පොල් සහ කජු වගාව සඳහා දිගු කාලීන බදු දී ඇත. මෙම ඉඩම් වල විවිධ ඉදිකිරීම් සිදුකරයි. එල්ලංගාවෙන් බටහිර ප්‍රදේශය කලපුවෙන් මායිම්වේ. මෙහි මසුන් ඇල්ලීමේ කර්මාන්තයේ යෙදෙන ප්‍රජාව තොටුපොළවල් පවත්වාගෙන යයි. එල්ලංවේ සිට කි.මී. 3 – 6 දක්වා දුරකින් කළපුව හමුවේ. සංචාරක කර්මාන්තය සඳහා සුදුසු කලාපයකි. කළාඔය ඉන්දියන් සාගරය හමුවන ස්ථානය ගඟේ වාඩිය ලෙස හඳුන්වයි. මෙම කලාපය දේශීය සංචාරකයින්ගේ සිත්ගත් ස්ථානයකි.

4.5 සමනළ වැව එල්ලංගවේ ජල විද්‍යාත්මක හා වාරිමාර්ග කළමනාකරණය තොරතුරු

සමනළ වැව එල්ලංගාවේ දේශගුණික රටාව අනුව මාර්තු සිට ඔක්තොබර් දක්වා මාස අටක ඍතුමය හා වාර්ෂික වියලි කාලයක් පවතියි. එල්ලංගාවට වැඩිම වර්ෂාපතනයක් හිමිවන්නේ ඊසාන දිග මොසමෙනි. මෙම වර්ෂාපතනයත් සමගම වාර්ෂික ගංවතුර තත්වයකට සමස්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂය මෙන්ම එල්ලංගාවද මුහුණු දෙයි. එල්ලංගාවේ භූදර්ශකයේ පැතලි, සමතලා හා බෑවුම් සහිත පිහිටීම හේතුවෙන් එහි බෑස්ම ඉතා දුර්වල වේ. මෙම එල්ලංගාව ඇතුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයේ පවතින අනෙකුත් එල්ලංගාවන් පැරන්නන් විසින් සැලසුම් කර ඇත්තේ ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපාය සඳහාම නොව එහි පවතින ශාක හා සත්ව පද්ධතියේ ස්ථිර පැවැත්ම සඳහාය.

CSIAP ව්‍යාපෘතිය මගින් පද්ධතියේ පුනරුත්තාපනයත් සමග ජල කළමනාකරණය පිළිබඳව ගොවීන්ට පුහුණුවක් ලබාදී ඇත. එහෙත් වැව පහල ඇළ පද්ධතියේ තත්වය අනුව ජල කළමනාකරණය කිරීම පිළිබඳව ගැටළු පැන නගී. කඩිනමින් යටිගං සංවර්ධනය කල යුතුය.

පහත වගු සටහනින් එල්ලංගාවට ලැබෙන වර්ෂාව පිළිබඳව දළ අදහසක් ලබාදීමට උත්සාහ ගෙන ඇත.

මෝසම් හා සංවහන වැසි රටාව

අනු අංකය	මෝසම	මාසය	වර්ෂාපතනය
01	පළමු අන්තර් මෝසම	මාර්තු - අප්‍රේල්	100-120 mm
02	නිරිතදිග මෝසම	මැයි - සැප්තැම්බර් /ජූනි	වියලි කාලය
03	දෙවන අන්තර් මෝසම	ඔක්තෝබර් - නොවැම්බර්	-
04	ඊසාන දිග මෝසම	දෙසැම්බර් - පෙබරවාරි	300 – 400 mm

මෝසම් හා සංවහන වැසි ධාරාවන් සමග එල්ලංගාවේ තත්වය මුළුමනින්ම වෙනස්වේ. ගංවතුර අනුව බොහොමයක් ගම්මාන හුදකලා වේ. කළා ඔය රාජාංගනය ජලාශය හා මී ඔය පද්ධති උතුරායාම නිසා එහි බලපෑමට මුළුමනින්ම වනාතවිල්ලුව කලාපයම ගොදුරු වේ. මේ නිසා ඇතිවන ගං වතුරෙන් දියළු පස් අංශු එල්ලංගාව තුල තැම්පත් වීම කෘෂිකාර්මික කටයුතු වලට අහිතකර වේ. වාරිමාර්ග පද්දතිය සමනල වැව එල්ලංගාව තුළ පිහිටි සමස්ත භූමි ප්‍රමාණය හෙක් 7504 කි. මින් ඉහත සඳහන් වැව් 10 යටතේ කුඹුරු හෙක් 88 ක් පමණ පිහිටා ඇත. මෙම වැව් වල පුනරුත්ථපන කටයුතු 90% අවසන්ය. මින් වැව් 04 ක් අතීතයේ ඔලගම් වැව් වශයෙන් පවතින්නට ඇති බවට හඳුනාගත හැකිය. පහත වගු සටහන අනුව පිලිවෙලින් අක් 2.5 – 67 දක්වා පරාසයක පිහිටා මෙම වැව් වල කුඹුරු ව්‍යාප්ත වේ. සමනල වැවෙන් ආරම්භ වන එල්ලංගාවේ ජලය අවසාන වශයෙන් ගලා යන්නේ පෙරිය විල්ලුව වැව හරහා කලපුවටයි. එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් වල ඉතා සුළු ගොවීන් සංඛ්‍යාවක් සිටීම විශේෂත්වයකි. කදිරන්කඩුව, නාගමඩුව, සාලියපුර, මහා වීරක්කුලිය, සමනල වැව හා මහතම්ණෑව වැව යන වැව් වල අක්. 20 – 63 ක පරාසයෙන් කුඹුරු ව්‍යාප්ත වේ. කදිරන්කඩුව වැවේ පමණක් කුඹුරු අක් 63 කි. මේ තත්වය අනුව වැව්වල නඩත්තුව ඉතා දුර්වල බව සඳහන් කලයුතුය. වැව් බැම්මේ සහ ඇල වේලි වල නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදු නොවේ. මෙයට හේතුව වන්නේ වැව යටතේ වගා කන්නයට පමනක් නඩත්තු කිරීමයි. වගාවක් නොවන කන්න වල නඩත්තුව සිදු නොවේ. මෙහි එක් වැවකට එක් ගොවි සංවිධානයක් පැවතීම මෙහි ඇති විශේෂත්වයකි. බොහෝදුරට කුඹුරු වගාවට පමණක් ගොවීන් මෙහි සාමාජිකත්වය දරණ බව පෙනේ. ගොවි සංවිධානයේ ක්‍රියාකාරී තත්වය හා නීති රීති ද නඩත්තුව දුර්වල වීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වයද සෘජුවම බලපානු ලබයි. තවද රක්ෂිත හා අනවසර ගොවීන් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා සහභාගී නොවේ. මෙම තත්වය යටතේ වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනයෙන් පසු සුළු කලකින්ම නැවත හායනයට පත්විය හැකිය. වැව් තාවලු වගාව ආරක්ෂා කර ගැනීමට වැවේ ජලය අනවසරයෙන් මුදාහැරීමට අනවසරකරුවන් කටයුතු කිරීම ප්‍රබල ගැටලුවකි. වැව් වල සොරොව්, ඇලවල්, වාන වැනි අංගෝපාංග වලට හානි කිරීම ද දැකිය හැකිය. මෙවැනි තත්වයන් යටතේ ජල කළමනාකරණය කිරීමටද බාධා පමුණුවයි.

සමනළ වැව එල්ලංගවේ වැව්

අනු අංකය	වැවේ නම	වැව යටතේ පවතින කුඹුරු ඉඩම් (අක්කර)	සැබෑ වගා කළ හැකි ප්‍රදේශය (අක්කර)	
			යල	මහා
1	සමනල වැව	26	8	37
2	මහතම්ණෑව වැව	20	1	35
3	කුඩා තම්මැන්නාව වැව	6	13	13
4	පුංචි වීරක්කුලිය වැව	12	0	18
5	මහා වීරක්කුලිය වැව	37	15	47
6	ජය වැව	2.5	0	5
7	සාලියපුර වැව	22	8	8
8	පහන් වැව	09	0	15
9	කදිරන්කඩුව වැව	63	15	63
10	නාගමඩුව වැව	22	8	4.75
මුළු		219.5	68	245.75

වැව් යටතේ වගාකරන කුඹුරු හා ගොවි පවුල් සංඛ්‍යාව

වැවේ නම	වැවේ ප්‍රමාණය (අක්කර)	වැව යටතේ වගාකරන කුඹුරු (අක්කර)	ගොවි පවුල් සංඛ්‍යාව
කුඩා තම්මාන්නා කුලම	13	06	17
මහතම්මැන්නා කුලම	24	20	75
මහ වීරක්කුලිය වැව	30	37	63
ජයවැව	02	2.5	34
පහන්වැව	24	09	18
පුංචි වීරක්කුලිය වැව	12	12	23
සමනළ වැව	35	26	65
කදිරන් කාඩු වැව	32	63	63
නාග මඩුව	22	22	60
සාලියපුර	22	22	30

එල්ලංගාවේ වැව් යටතේ අස්වද්දනු ලබන කුඹුරු හා ගොවීන් සංඛ්‍යාව

එල්ලංගාවේ ගොවි සංවිධාන

අනු අංකය	වැවේ නම	ගොවි සංවිධාන
01	සමනල වැව	සමනල වැව ගොවි සංවිධානය
02	මහතම්මන්නෑව වැව	මහතම්මන්නෑව ගොවි සංවිධානය
03	කුඩා තම්මැන්නාව වැව	කුඩා තම්මැන්නාව වැව ගොවි සංවිධානය

04	පුංචි වීරක්කුලිය වැව	පුංචි වීරක්කුලිය වැව ගොවි සංවිධානය
05	මහා වීරක්කුලිය වැව	මහා වීරක්කුලිය වැව ගොවි සංවිධානය
06	ජය වැව	ජය වැව ගොවි සංවිධානය
07	සාලියපුර වැව	සාලියපුර වැව ගොවි සංවිධානය
08	පහන් වැව	කදිරන්කඩුව වැව ගොවි සංවිධානය
09	කදිරන්කඩුව වැව	කදිරන්කඩුව වැවේ ගොවි සංවිධානය
10	නාගමඩුව වැව	නාගමඩුව වැව රුවන් ගොවි සංවිධානය

4.6 එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

වැව් සහ ඇළ දොළ ජාලයක් හරහා එක් වැවක සිට තවත් වැවකට ජලය ගලා බැසීමේ කාර්ය සැලසුම් කර කාර්යක්ෂම ජල කළමනාකරණයක් සඳහා ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. සියවස් ගණනාවක් පැරණි වැව් පරිසර පද්ධතිය එය අවට ජීවත් වන ගම්වාසීන්ට ඔවුන්ගේ දෛනික අවශ්‍යතා වන ආහාර, ඖෂධ, ඉන්ධන, දැව වැනි මිනිසාගේ තිරසාර පැවැත්මට අවශ්‍ය සේවා සමූහයක් ලබා දී ඇත.

තවද මිනිසා හා සතුන් කලින් කලට මුහුණු දෙන ස්වභාවික විපත් සහ දේශගුණික විපර්යාසයන්ට එරෙහිව අද්විතීය ස්වාරක්ෂකයක් ලෙසද කටයුතු කරයි. ඉහත කරුණු සලකා බැලීමෙදී එල්ලංගා වාසීන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳව සලකා බැලීම වැදගත්ය. සමනල වැව එල්ලංගාව තුළ පිහිටි සමස්ත භූමි ප්‍රමාණය හෙක් 7504 කි. මින් ඉහත සඳහන් වැව් 10 යටතේ කුඹුරු හෙක්. 88 ක් පමණ වගාකරයි. ගොඩ ඉඩම් හෙක්. 2190 පමණ වේ. එල්ලංගාව තුළ කුඹුරු හා අතිරේඛ බෝග වගාව පොල් හා කජු වගාව සිදුකරන අතර මෙම වගා කටයුතු වල නිරත වන ගොවීන් සංඛ්‍යාව 230 පමණ වේ. එල්ලංගාව තුළ ජීවත්වන සමස්ත ජනගහනය 1739 කි. ගැහැණු පිරිමි වශයෙන් සලකා බැලීමේදී 50 % කට සුළු ප්‍රමාණයක් වැඩියෙන් පිරිමි ජනගහනය නියෝජනය කරයි. කජු වගාව හා පොල් වගා කටයුතු වල කම්කරුවන් ව්‍යවසායකයින් ලෙස රැකියාවල යෙදී සිටි. මීට අමතරව ගොඩ ඉඩම්වල එළවලු වගාව සිදුකරයි. මත්ස්‍ය නිෂ්පාදනය කලාපය තුල සිදුවේ. කම්කරුවන් ගෙවතු වගාවේ යෙදෙන ගොවීන් හා ස්වයං රැකියාවල නියුතු හා කළපුවේ මත්ස්‍ය නිෂ්පාදනයේ යෙදෙන්නන් ද සිටී. තවද අලවි කටයුතු වල යෙදෙන ව්‍යාපාරිකයන් හා අලවිසැල් පවත්වාගෙන යන වෙළඳ ප්‍රජාවද එල්ලංගාව තුල වාසය කරයි.

4.7 එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

එල්ලංගාවට අයත් වගා කල හැකි මුළු භූමි ප්‍රමාණයෙන් ගොඩ ඉඩම් ලෙස අක්කර 156 කුත් හා මඩ ඉඩම් ලෙස අකක්ර 220 කුත් වගා කටයුතු කරනු ලබයි. ගොඩ වගාව ලෙස එලවළු විරගත් එනම් මිරිස්, වම්බටු, කරවිල, මඤ්ඤොක්කා, පතෝල, මැකරල් හා පළතුරු ලෙස කොමඩු, ගස්ලබු, කෙසෙල් හා මුං, කව්පි, බඩ ඉරගු වැනි ධාන්‍ය වර්ගත් වගාකරනු ලැබේ.

එල්ලංගාව තුළ වගා කරන බෝග වර්ග					
උස්බිම්			ගෙවතු බිම්		
යාල	මහා	වාර්ෂික /බහු වාර්ෂික	යල	මහා	වාර්ෂික / බහු වාර්ෂික
රටකජු	රටකජු බඩ ඉරිඟු කව්පිවී	පොල්	එළවළු	එළවළු	පොල්
ගර්කින් ඉරිඟු / බඩ ඉරිඟු කොමඩු	කව්පි කොමඩු රටකජු				
ගර්කින් ඉරිඟු / බඩ ඉරිඟු කොමඩු මිරිස්	ගර්කින් කොමඩු කව්පි රටකජු එළවළු	තිබ්බටු අඹ තැඹිලි	එළවළු	එළවළු	
රටකජු	රටකජු කව්පි වී	කජු			තැඹිලි කජු

එල්ලංගාවේ යල මහ කන්න වලදී වගා කරණු ලබන බෝග

4. 8 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

එල්ලංගාවේ ගොවීන් මතු කරන ලද ප්‍රධාන ගැටළු

- වල් අලි හා අනෙකුත් සතුන්ගෙන් සිදුවන හානි
- එල්ලංගාව අවට ප්‍රදේශයේ පානීය ජල හිගය
- සියලුම වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමට සිදුව ඇත්තේ වැව් ප්‍රතිසංස්කරණයේ මුල් අත්දැකීම හොඳ නැති බැවිනි
- වාරිමාර්ග ඇල සහ පද්ධතිය අර්ධ වශයෙන් හානි වීම

- කුඹුරු ඉඩම්වල ලවණතාව වැඩි වීම
- කෘෂි පාර වල් හානි වීම

එම නිරීක්ෂණ චාරිකාවෙන් පසු ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේ දී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකි වූ අතර ගොවි සංවිධාන හා නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකිවිය. මෙසේ හඳුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත. තවද උපාය මාර්ගික මැදිහත්වීම් හා මැදිහත්විය යුතු ආයතන පිළිබඳව තක්සේරුවක් කර දළ ඇස්තමේන්තුවක් සකස් කර කාලරාමුවක්ද අමුණා ඇත. මෙම වාර්ථාව එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර සාකච්ඡා කර ක්‍රියාවට නැංවිය යුතුය. මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීමට ගොවිජන සංවර්දන දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන මුලිකත්වය ගතයුතුවේ. එමෙන්ම එල්ලංගා කළමනාකරණ කමිටුවේ මුළිකත්වය ද ප්‍රධානවේ.

4.9 උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

වගු අංක 11

අනු අංක	උග්‍ර ගැටළු	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්	මැදිහත්වන යත ආයතන
1	කට්ටකඩුවක් හා පෙරනයක් නොමැත. (1600 m ප්‍රමාණයක්) (පුංචි වීරක්කුලිය මහතම්මැන්නා කුලම කුඩා තම්මන්නැකුලම සාලියපුර)	1. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම 2. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම 3. කට්ටකඩුව නිරීක්ෂණය කර ඒකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ට කඩුව වෙන් කිරීම 4. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම	1. ගොවි සංවිධාන 2. ගොවිජන සං.දෙ. 3. පළාත් වාරිමාර්ග දෙ. 4. කෘෂිකර්ම දෙ. 5. CSIAP/ CMC
2	කිවුල නිසා කුඹුරු වල අස්වනු හානිවීම. ගොයම හානිවීම. (සාලි යපුර වැව - 20 AC නාගමඩුව වැව -20 AC පුංචි වීරක්කුලිය වැව - 15 AC පහන් වැව - 9 AC	1. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම 2. කුණු ඇළ පද්ධතිය නඩත්තු කිරීම 3. පසේ තත්වය වැඩිදියුණු කිරීම සඳහා දහයියා අඟුරු	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.

	සමනල වැව - 5 AC කදිරන්කාඩුව වැව - 48 AC)	භාවිතයට ගොවීන් දැණුවත් කිරීම 4. ගොවීන්ට පුහුණුවක් ලබාදීම 5. පස් සාම්පල් පරීක්ෂාව	
3	වාන කැඩීම හේතුවෙන් වගාවට ප්‍රමාණවත් ජලය නොමැතිවීම. (නාග මඩුව වැව මහ වීරක්කුලිය වැව පහන් වැව -පැති බැම්ම කැඩී ඇත. කදිරන් කාඩු වැව)	1. CMC හිදී සාකච්ඡා කිරීම 2. කාන්දුවන ස්ථාන හදුනාගෙන තාක්ෂණික වාර්තාවක් ලබාගැනීම 3. සුදුසු ඇස්තමේන්තුවක් ලබාගැනීම 4. ගොවි සංවිධාන මගින් ප්‍රතිසංස්කරණය කිරීම	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
4	වැව් ඉස්මත්තේ හේන් වගාව හේතුවෙන් (පාංශු ඛාදනය) වැව් ගොඩවීම. (කුඩා තම්මැන්නා කුලම වැව ජය වැව කදිරන්කඩුව වැව)	1. හේන් වගාකර ඇති ස්ථාන හදුනා ගැනීම 2. ගොවීන් දැණුවත් කිරීම 3. ගොවි සංවිධාන හා CMC හිදී සාකච්ඡා කිරීම 4. පාංශු සංරක්ෂණ වැටි ඉදිකිරීම	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
5	කුණූ ඇල අවහිරයි (පුංචි වීරක්කුලිය වැව - 800M නාගමඩුව වැව - 500M කදිරන්කාඩුව වැව - 1.5KM සමනල වැව - 400 M)	1. ක්ෂත්‍රය පරීක්ෂා කිරීම 2. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම 3. ප්‍රතිපාදන සපයා ගැනීම 4. ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
6	සොරොව්වේ පැති බැම් පාත වැඩියි. පස් වැටී සොරොව්ව අවහිරවීම. (මහතම්මැන්නා කුලම වැව පුංචි වීරක්කුලම වැව පහන්වැව)	1. ක්ෂත්‍රය පරීක්ෂා කිරීම 2. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම 3. ප්‍රතිපාදන සපයා ගැනීම 4. ගොවි සංවිධානය මගින් අලුත්වැඩියා කිරීම	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.

7	යටිගත් සංවර්ධනය වී නැත. ඒ නිසා කුඹුරු වලට ජලය ලබාගත නොහැකිය. (සියළුම වැව් පෝෂිත ඇලවල් කදිරන්කාඩු වැව කුඩා තම්මැන්නා කුලම වැව ජයවැව)	1. CMC හිදී සාකච්ඡා කිරීම 2. අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම 3. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම 4. ගොවි සංවිධානය මගින් අලුත්වැඩියා කිරීම	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.

8	සියළු වැව් වල වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්තු ඉතා දුර්වලයි.	1. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම 2. නඩත්තු සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම	1. ගොවි සංවිධාන 2. CSIAP/ CMC 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
9	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම. (කුඩා තම්මැන්නා කුලම සාලිය වැව සියළුම වැව්)	1. CMC හිදී සාකච්ජාවට ගැනීම 2. ඇස්තමේන්තු කිරීම 3. ජලය අඩුවීමත් සමග නිර්දේශිතකෘමි නාශකයක් යෙදීම 4. පවත්වාගෙන යාම	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ. 5. කෘ.දෙ.

4.10 සමනළ වැව එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව

උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම්	දළ පිරිවැය (රු.මි)	කාලරාමුව														ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත්වීම්	
		කෙටි කාලීන 2024						මධ්‍යකාලීන 2025				දිගුකාලීන					
																ප්‍රධාන	අනෙකුත්
01. කට්ටකඩුවක් හා පෙරනයක් නොමැත. (1600 m ප්‍රමාණයක්) (පුංචි වීරක්කුලිය මහතම්මැන්නා කුලම කුඩා තම්මන්නැකුලම සාලියපුර)	1.0															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ. 5. කෘ.දෙ.	1. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
02.කුඹුරු ඉඩම්වල කිවුල වැඩියි. කිවුල නිසා කුඹුරු වල අස්වනු හානිවීම. (සාලි යපුර වැව - 20 AC නාගමඩුව වැව - 20 AC පුංචි වීරක්කුලිය වැව - 15 AC	2 .2															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.

පහන් වැව - 9 AC සමනල වැව - 5 AC කදිරන්කාඩුව වැව - 48 AC)																	
03. වාන කැඩීම හේතුවෙන් වගාවට ප්‍රමාණවත් ජලය නොමැතිවීම. (නාග මඩුව වැව මහ වීරක්කුලිය වැව)	0.5															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
04. වැව් ඉස්මත්තේ හේන් වගාව හේතුවෙන් (පාංශු ඛාදනය) වැව් ගොඩවීම. (කුඩා තම්මැන්නා කුලම වැව ජය වැව කදිරන්කඩුව වැව)	1.0															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
05. කුණු ඇල අවහිරයි. (පුංචි වීරක්කුලිය වැව - 800M නාගමඩුව වැව - 500M කදිරන්කාඩුව වැව - 1.5KM සමනල වැව - 400 M 3.2KM)	2 .3															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.

05. සොරොව්වේ පැති බැම් පාත වැඩියි. පස් වැටී සොරොව්ව අවහිරවීම . (මහතම්මැන්නා කුලම වැව පුංචි වීරක්කුලම වැව පහන්වැව)	0.7															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
6. ඇලවේලි සැකසීම. (සියළුම වැව් පෝෂිත ඇලවල් කදිරන්කාඩු වැව කුඩා තම්මැන්නා කුලම වැව ජයවැව)	2 .0															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.
8 වාරිමාර්ග පද්ධතිය කැලැවෙන් වැසී ඇත. නඩත්ත ඉතා දුර්වලයි. විධිමක් නඩත්තු වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම.	0.2															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන/ගොවීන් 2. CSIAP 3. ගොවිජන සං.දෙ.

9 ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම. (කුඩා තම්මැන්නා කුලම සාලිය වැව සියළුම වැව්)	0.2															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.	1. ගොවි සංවිධාන/ගොවීන් 2. CSIAP 3. ගොවිජන සං.දෙ. 4. පළාත් වාරිමාර්ග දෙ.

4.11 සමනල වැව එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තුව

අනු අංක	දළ ඇස්තමේන්තුගත වියදම සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් - සමනල වැවඑල්ලංගාව	ආසන්න වියදම් (රු.මි.)	2024/2025								
			ඔ/ නො	දෙ/ ජන	මා/ අප්‍රි	මැ/ ජන	ජන /අ	සැ/ ඔ	නො /දෙ		
1	කට්ටකඩුවක් හා පෙරනයක් නොමැත. (1600 m ප්‍රමාණයක්)	1 .0									
2	කිවුල නිසා කුඹුරු වල අස්වනු හානිවීම. ගොයම හානිවීම.	2 .2									
3	වාන කැඩීම හේතුවෙන් වගාවට ප්‍රමාණවත් ජලය නොමැතිවීම.	.5									
4	වැව් ඉස්මත්තේ හේන් වගාව හේතුවෙන් (පාංශු ඛාදනය) වැව් ගොඩවීම.	1.0									
5	කුණූ ඇල අවහිරයි.	2.3									
6	සොරොව්වේ පැති බැම් පාත වැඩියි. පස් වැටී සොරොව්ව අවහිරවීම.	0.7									
7	යටිගන් සංවර්ධනය වී නැත. ඒ නිසා කුඹුරු වලට ජලය ලබාගත නොහැකිය.	2.0									

8	සියළු වැව් වල වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්ත ඉතා දුර්වලයි.	0.2									
9	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම.	0.2									
	මුළු එකතුව	10.1									

ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය எனது இல. My No.	7/3/9/CMC/2023	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023.08. 03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>
<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

- **i.** එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.
- **ii.** වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා ගොවීන් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රීයව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායි ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සෑම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

3.4. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවේ සංයුතිය

3.4.1 ප්‍රාදේශීය මට්ටම

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

- **i.** ප්‍රාදේශීය ලේකම්
- **ii.** ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
- **iii.** කෘෂිකර්ම උපදේශක
- **iv.** පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
- **v.** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
- **vi.** කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
- **vii.** ග්‍රාම නිලධාරි
- **viii.** සමෘද්ධි සංවර්ධන නිලධාරි
- **ix.** ආර්ථික සංවර්ධන නිලධාරි
- **x.** ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xi.** පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xii.** ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
- **xiii.** පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
- **xiv.** පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
- **xv.** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xvi.** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
- **xvii.** වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරි
- **xviii.** වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xix.** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xx.** භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
- **xxi.** ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
- **xxii.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xxiii.** සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xxiv.** පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
- **xxv.** ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
- **xxvi.** ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.

3.5. <u>එල්ලංගා පද්ධති කළමණාකරණ</u> <u>කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම</u>

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සැම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

3.6. <u>එල්ලංගා පද්ධති කළමණාකරණ</u> <u>කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම</u>

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සැම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

6